
❖ ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

01. දත්තයක් තොරතුරකින් වෙනස් වන ආකාර 03 ක් ලියන්න.

02. දත්ත හා තොරතුරු සඳහා උදාහරණ 03 බැගින් ලියන්න.

03. පහත සටහන සම්පූර්ණ කරන්න.



04. සමන් ATM යන්ත්‍රයකින් කාඩ්පත භාවිත කර ඔහුගේ ගිණුමෙන් රු. 1000/- ක් හා ඊට අදාල රිසිට් පතක් ලබාගනී. ඉහත කාර්යයේදී සිදුවූ/සිදුවිය හැකි ආදාන, ක්‍රියාවලි හා ප්‍රතිදාන වෙන වෙනම ලියා දක්වන්න.

05. ගුණාත්මක තොරතුරක තිබිය හැකි ලක්ෂණ 05 ක් ලියන්න.

06. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ක්ෂේත්‍ර 05 ක් එම ක්ෂේත්‍ර වලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ආකාර සඳහා උදාහරණ 03 ක් සමග දෙන්න.

07. ඊ-රාජ්‍යය ලෙස අදහස් වන්නේ කුමක්ද? කෙටියෙන් සටහන් කරන්න.

08. ඊ-රාජ්‍යය තුල සිදුවන සම්බන්ධතා එක් එක් සම්බන්ධතාවයට උදාහරණ 03 ක් සමග ලියන්න.

09. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් මගින් ශිෂ්‍යයකුට හා කළමනාකරණ අංශයට ලබාගත හැකි පහසුකම් 03 බැගින් ලියන්න.

10. සෞඛ්‍ය ක්ෂේත්‍රයේදී වෛද්‍ය පරීක්ෂණ සඳහා භාවිත වන නවීන තාක්ෂණික උපකරණ 05 ක් එයින් ඉටු කරගනු ලබන කාර්යය සමගින් දක්වන්න.

11. දුරස්ථ සෞඛ්‍ය රැකවරණය යනු රෝහලකින් බැහැරව සිටින රෝගියකු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් පහසුකම් ලබාදීමයි. එය සිදු කල හැකි ආකාර පිළිබඳ ව උදාහරණ 03 ක් ලියන්න.

12. වගා බිමේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම සඳහා ගැලපෙන උදාහරණ 05 ලියන්න.

www.ledu.lk

13. ගුවන් විදුලි සංඥා හැඳුනුම් (RFID-Radio Frequency Identification Device) භාවිත කරන්නේ කුමන කාර්යකටද? උදාහරණයක් දෙන්න.
14. රොබෝ තාක්ෂණය භාවිත කිරීමේ වාසි 03 ක් ලියන්න.
15. ඉ-බැංකු පද්ධතියකින් ලබා ගත හැකි වාසි 03 ක් සඳහන් කරන්න.
16. මාර්ගගත සාප්පු සවාරිය යනු මෙරට හෝ පිටරට ඇති වෙළඳ ආයතනයකින් අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ හෝ සේවා සැපයීම, පාරිභෝගිකයා විසින් භාණ්ඩ හෝ සේවා ලබාගැනීම වේ. එමගින් සිදු විය හැකි වාසි 03 ක් හා අවාසි 02 ලියන්න.
17. මානව සම්පත් කළමනාකරණය සඳහා දැනට බොහෝ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලදී යොදගෙන ඇති උපක්‍රමය වන්නේ කුමක්ද?
18. විනෝදාස්වාදය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම පිළිබඳව උදාහරණ 05 ක් ලියන්න.
19. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අනිසි ප්‍රතිඵල 05 ක් සඳහන් කරන්න.
20. ලොව ප්‍රථම යාන්ත්‍රික ගණිත කර්ම විසඳිය හැකි යන්ත්‍රය නම් කරන්න.
21. චාල්ස් බැබේජ් පරිගණකයේ පියා ලෙස සැලකීමට හේතු වූ යන්ත්‍රය හා එම යන්ත්‍රයේ තිබූ අදටද භාවිත වන මූලික සංකල්ප නම් කරන්න.
22. ප්‍රථම පරිගණක ක්‍රම ලේඛිකාව ලෙස හදුන්වන්නේ කවරෙක්ද?
23. පරිගණකය පරම්පරාව අනුව කොටස් කිහිපයකට බෙදන ලද අතර එම එක් එක් කාල වලදී භාවිත කරන ලද විශේෂිත තාක්ෂණික උපකරණ වෙන් වෙන්ව දක්වන්න.
24. පළමු පරම්පරාවේ පරිගණක සඳහා උදාහරණ 02 ක් ලියන්න.
25. පළමු පරම්පරාවේ පරිගණක භාවිතා කරන ලදහ පරිගණක භාෂාව කුමක්ද?
26. පළමු පරම්පරාවේ පරිගණක දන්න හා තොරතුරු ආචයනය සඳහා සිදුරු පත් භාවිත කළ අතර දෙවන පරම්පරාවේ පරිගණක දන්න හා තොරතුරු ආචයනය සඳහා යොදා ගත් උපක්‍රම 02 ක් ලියන්න.
27. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් සහිත මෙහෙයුම් පද්ධති භාවිතයට පැමිණියේ කිනම් පරම්පරාවේ පරිගණක සමගද?
28. ප්‍රකාශ තැටි ද්විතියික ආචයනය සඳහා භාවිත කරන ලද්දේ කිනම් පරම්පරාවේ පරිගණක සමගද?
29. පස්වන පරම්පරාවේ පරිගණක වල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න.
30. පරම්පරාව සමග ඉදිරියට යාමේදී පරිගණකයේ හා තාක්ෂණයේ සිදුවූ වෙනස්කම් මොනවාද?

www.kedu.lk